**දේව ප්‍රකාශන**

චතාරික සමයපස්වන ඉරුදින 25-03-12

## පළමුවන කියැවීම

ජෙරමියා 31:31-34

ජෙරමියා දිවැසිවරයාගේ පොතෙන් ගත් පාඨයකි.

"මම ඔවුන්ගේ පව් අමතක කොට ඔවුන් හා නව ගිවිසුමක් කරන්නෙමි."

සමිඳුණන් වහන්සේ මෙසේ වදාරණ සේක. "ඉශ්‍රායෙල් සෙනග හා ජුදා සෙනග සමග ද මා අලුත් ගිවිසුමක් කරන කාලය පැමිණෙන්නේ ය. ඒ වනාහී ඔවුන්ගේ පියවරුන් මිසර දේශයෙන් ගෙන එන්නට මා පියවර ගත් කාලයේ දී ඔවුන් සමග කළ ගිවිසුම මෙන් නොවේ. මා ඔවුන්ට ස්වාමි පුරුෂයෙකු මෙන් සිටි නමුත්, ඔවුන් සමග මා කළ ගිවිසුම ඔව්හු කඩ කළෝ ය. මෙස් පවසන්නේ ස්වාමින් වන මම ය. එහෙත්, ඒ කාලය පැමිණි විට, ඉශ්‍රායෙල් සෙනග සමග මා කරන ගිවිසුම මෙය වේ. මම මාගේ අණ පණත් ඔවුන් තුළ පිහිටුවා එය ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි. මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි. ඔව්හු මාගේ සෙනග වන්නෝ ය. මෙස් පවසන්නේ ස්වාමින් වන මම ය. "සමිඳුණන් වහන්සේ හඳුනාගන්න" කියා එකිනෙකා තම තමාගේ අසල්වැසියාට ද සහෝදරයාට ද උගන්වන්නට වුවමනා වන්නේ නැත. මන්ද, ඔවුන්ගෙන් කුඩා අය පටන් ලොකු අය දක්වා සියල්ලන්ම මා හැඳින ගනු ඇත. මම ඔවුන්ගේ අපරාධ කමා කරන්නෙමි. ඔවුන්ගේ පාප තවත් සිහි නොකරන්නෙමි. මෙස් පවසන්නේ ස්වාමින් වන මම ය."

දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 51:1-2, 10-13

පිළිතුර: දෙවිඳුනී, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව.

ගීය: දෙවිඳුනී, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව. ඔබේ විපුල දයාවෙන්මාගේ අපරාධ මකා දැමුව මැනව. මාගේ කෙලෙස් මලින් මා මුළුමනින් සෝදාලුව මැනව. මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව.

දෙවිඳුනී, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව. තිරසර නව දිවියක් මට දුන මැනව. ඔබ හමුයෙන් මා පලවා නොහැරිය මැනව. ඔබේ ශුද්ධාත්මය මා කෙරෙන් ඉවත් නොකළ මැනව.

විමුක්තියේ ප්‍රීතිය මට යළි දුන මැනව. අවනත සිතක් දී මා දැරුව මැනව. එවිට මම අපරාධකරුවන්ට ඔබ මග පහදා දෙන්නෙමි. පව්කරුවන් ඔබ වෙත හරවා ගෙන එන්නෙමි.

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 5:7-9

හෙබ්‍රෙව්වරුන්ට වෙත යැවූ ලද හසුනෙන් ගත් කොටසකි.

"උන්වහන්සේ දුක් විඳීමෙන් කීකරුකම ඉගෙන සියල්ලන්ගේ සදාතන විමුක්ති දායකයාණන් වූ සේක."

ක්‍රිස්තුස් වහන්සේ මිනිසත් බව ගෙන සිටියදී තමන් මරණයෙන් ගළවන්නට පිළිවන් වූ තැනන් වහන්සේට බලවත් හැඬීමෙනුත් කඳුළු සැලීමෙනුත්, යාච්ඤා ද කන්නලවු ද ඔප්පු කළ සේක. උන්වහන්සේගේ දේව ගරු බිය නිසා දෙවියන් වහන්සේ එයට සවන් දුන් සේක. උන්වහන්සේ පුත්‍රයාණන් වූ නමුත්, තමන්ගේ දුක් විඳීමෙන් කීකරුකම ඉගෙන ගත් සේක. මෙසේ උන්වහන්සේ සම්පූර්ණත්වය ලැබ, තමන් වහන්සේට කීකරුවන සියල්ලන්ගේ සදාතන විමුක්ති දායකයාණෝ වූ සේක.

දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

ජුවාම් 12:26

"යමෙක් මට සේවය කරන්නේ ද, ඔහු මා අනුගාමී විය යුතුයි. මම යම් තැනෙක සිටිම් ද මාගේ සේවකයා එහිම සිටිනු ඇත." ස්වාමින් වහන්සේ වදාළ සේක.

## ශුද්ධවූ සුවිශේෂය

ජුවාම් 12:20-33

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

බීජය පොළොවෙහි වැටී මළොත් එය සරු ලෙස පල දරයි.

මංගල්‍යයේදී නමස්කාර කරන පිණිස ගියවුන් අතර, ග්‍රීකයෝ සමහර දෙනෙක්ද සිටියහ. ඔව්හු, ගලීලයේ බෙත්සයිදවේ පිලිප් වෙතට පැමිණ, "මහතාණෙනි, අපි ජේසුස්වහන්සේ දකින්නට කැමැත්තෙමු"යි කීහ. පිලිප් එය ඇන්ඩෘට කීය. ඇන්ඩෘ ද පිලිප් ද ජේසුස් වහන්සේට සැළ කළහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මනුෂ්‍ය පුත්‍රයාණන් මහිමයට පමුණුවනු ලබන නියමිත මොහොත පැමිණ තිබේ. ඒකාන්තයෙන් ම මම ඔබට කියමි, තිරිඟු බීජය පොළොවෙහි වැටී නොමළොත් එය තනි බීජයක් පමණක් වේ. එහෙත් එය මළොත් සරු ලෙස පල දරයි. තම ජීවිතයට ඇලුම් කරන්නා එය නැති කරගනියි. මෙලොව තම ජීවිතයට ද්වේශ කරන්නා එය සදතන ජීවනය සඳහා රැකගනියි. යම් තැනැත්තෙක් මට සේවය කරන්නේ ද, ඔහු මා අනුගාමී විය යුතුයි. මම යම් තැනෙක සිටිම් ද මාගේ සේවකයා ද එහිම සිටිනු ඇත. යමෙක් මට සේවය කරන්නේ ද මාගේ පියාණෝ ඔහුට ගෞරව කරන සේක."

"දැන් මාගේ සිත කැළඹී ඇත. ඉදින් මම කුමක් කියම් ද? 'පියාණෙනි, මේ මොහොතෙන් මා ගැළවුව මැනවැ' යි කියම් ද? නැත, මා මේ මොහොතට පැමිණියේ මේ උදෙසාමය. පියාණෙනි, ඔබගේ නාමය මහිමයට පැමිණවුව මැනවැ"යි වදාළ සේක. එවිට, "මම එය මහිමයට පැමිණවීමි, යළිත් මහිමයට පමුණුවන්නෙමි" යි ස්වර්ගයෙන් හඬක් නික්මිණි. එහි සිටි සමූහයා එය අසා, "ගිගුරුමකැ" යි කීහ. ඇතැමෙක්, "දේව දූතයෙක් උන්වහන්සේට කතා කෙළේය" යි කීහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මේ හඬ පැමිණියේ මා උදෙසා නොව ඔබ උදෙසාය. මේ ලෝකය පිළිබඳ විනිශ්චය මොහොත දැන් ය. මේ ලෝකයේ අධිපතියා දැන් පරාජය කරනු ලැබේ. තවද මා පොළොවෙන් ඔසවනු ලැබූ කල, සියල්ලන් මා වෙතට ඇදගන්නෙමි" යි වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාළේ, තමන් වහන්සේ විඳින්නට යන්නේ කෙබඳු මරණයක් දැයි හඟවන පිණිසය.

සුවිශේෂ වාක්‍යය එසේ ය.